Mathematics.lk

FOR FUTURE EDUCATION IN SRI LANKA

Sri Lanka First and Only Mathematics Educational Website

Visit Our Website for More;

© LAHIRU KADURUGAMUWA EDUCATIONAL FOUNDATION

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2018<br>**උපකාරක ප්‍රශ්න පත්‍රය** | | | |
| ශ්‍රේණිය: 11 | විෂය: **සිංහල භාෂාව හා සාහිත්‍යය** | පත්‍රය: **II** | කාලය: පැය 2යි |
| නම:........................................................................................ | | | |

(1) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''ඥ'' අකුරෙන් ඇරඹෙන වචන අකාරාදි පිළිවෙළට සකස් කළ විට ඒවා යෙදෙන්නේ කිනම් අක්ෂර දෙක අතර ද?

(අ) ........................................ (ආ) ........................................

(ii) පහත දැක්වෙන වචන දෙක යොදා අර්ථවත් වාක්‍ය දෙකක් ලියන්න.

(අ) ලවණ (ආ) ලවන

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

අපගේ දේශීය බුද්ධියට හා දෘෂ්ටියට නොගැළපෙන වැඩ පිළිවෙලක් ජනතාව මත බලහත්කාරයෙන් පටවනු ලැබ ඇත.

(අ) ........................................ (ආ) ........................................

(iv) ''සිරුර පැයෙනු ගත් සුදනෝ ලොවේ
නොහඳුනත් උතුමන් ගුණයෙන් විනා'' මෙහි ඇතුළත් අව්‍යය පද දෙකක් උපුටා දක්වන්න.

(අ) ........................................ (ආ) ........................................

(v) පහත දැක්වෙන පද විසන්ධි කර දක්වන්න.

(අ) මෙහෙසුරු ........................................

(ආ) සද්ගුණ ........................................

(vi) ''අමදියි'' යන ක්‍රියා පදයේ ධාතු ප්‍රකෘතිය ඇසුරෙන් පහත දැක්වෙන ක්‍රියාපදවලට නිදසුන් ලියන්න.

(අ) මිශ්‍ර ක්‍රියාව ........................................

(ආ) අසම්භාව්‍ය ක්‍රියාව ........................................

(vii) පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය ලියන්න.

(අ) හේතු අනුව යමක් සිතා ගැනීම ........................................

(ආ) අලුතින් යමක් සෙවීම ........................................

mathematics.lk

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.

(අ) මිතුරෝ සමග මම ක්‍රීඩා තරගය නැරඹුවෙමි. ..................................................

(ආ) ඕ තොමෝ මහත් වූ පිංකම්හි යෙදෙන ලද්දීය. ..................................................

(ix) පහත දැක්වෙන පද අයත් සමාස වර්ගය දක්වන්න.

(අ) දස පනත ..................................................

(ආ) කිරිබත් ..................................................

(x) පහත දැක්වෙන ප්‍රාදේශීය යෙදුම් සඳහා වූ පොදු වහර ලියන්න.

(අ) පල්ල ..................................................

(ආ) අප්පල්ල ..................................................

(ලකුණු 20යි)

(2) පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ඕනෑම රටක සංස්කෘතිය, උරුමය පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන්නේ භාෂාව මඟිනි. හෙළ බසේ අනන්‍යතාව හැඳින ගැනීමේ දී එහි ඉතිහාසය හා ක්‍රමික විකාශනය පිළිබඳ දැන සිටීම වැදගත් වේ. සිංහල භාෂාවට එයට ම ආවේණික වූ භාෂා රටා සම්ප්‍රදායක් පවතී. ඒවා ආරක්ෂා කරමින් එහි උන්නතිය උදෙසා කටයුතු කිරීම අද අභියෝගයක් ව පවතී.

(ආ) ස්වභාව සෞන්දර්යයෙන් අනූන අතීත උරුම රැසකට හිමිකම් කියන ශ්‍රී ලංකාව සුන්දර දිවයිනකි. රට විදේශ ආධිපත්‍යයට ලක් වූ විටදීත් නිදහස ලැබීමෙන් පසුවත් තම ජන්ම භූමියේ අගය, ගෞරවාන්විත හැඟීම්වලින් යුතුව මුදා හැරීමට දේශාභිමානී ගීත සාහිත්‍යයක් බිහි විය. ඒවා බොහොමයක් සාහිත්‍යමය ගුණයෙන් ද සුපෝෂිත වී ඇත. නමුත් වර්තමානය බිහි වන බොහෝ ගී නිර්මාණ දේශාභිමානී හැඟීම් ජනනය පවා සාහිත්‍යමය ගුණයෙන් ද විනිර්මුක්තව ඇති බව පෙනේ.

(ඉ) සීමිත සම්පතක් වූ ජලය ජීවයේ පැවැත්මට අත්‍යවශ්‍ය ම සාධකයකි. එහි වටිනාකම අතීත ජනය හොඳින් දැන සිටි නිසා හොඳ ජල කළමනාකරණ ක්‍රමවේදයක් එදා ක්‍රියාත්මක විය. වර්තමානය ජල සම්පත විශාල වශයෙන් දූෂණයට ලක් වෙමින් පවතී. ජල සම්පත සුරැකීම ජීවයේ පැවැත්ම යහපත් ලෙස පවත්වා ගැනීමට විශාල පිටිවහලකි.

(ඊ) පසුගිය දස අවුරුදු කාලයේ දී ලෝකයේ හා ශ්‍රී ලංකාවේ ස්වාභාවික අනතුරු වැඩි වෙමින් පවතී. ඒ අතුරින් කඳු නාය යාම නිසා සිදු වූ ජීවිත හානි හා දේපළ හානි තිමක් නොමැත. මෙයට ප්‍රධාන හේතුවක් වී ඇතත් මිනිස් ක්‍රියාකාරකම් ය. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මෙවැනි ආපදාවන්ට මුහුණදීම නිසා සංවර්ධන ඉලක්ක ජය ගැනීම දුෂ්කර වී ඇත.

(ලකුණු 25යි)

mathematics.lk

(5) කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, ප්‍රාදේශීය මට්ටමින් සංවිධානය කරනු ලබන "ගමට සවිය" ව්‍යාපෘතිය සඳහා ග්‍රාමීය කර්මාන්ත පිළිබඳව තොරතුරු රැස් කිරීම ආරම්භ කර ඇත. ග්‍රාමීය සම්පත් අමුද්‍රව්‍ය ලෙස යොදාගෙන ජාත්‍යන්තර වෙළෙඳ පොළ ඉලක්ක කර සංවිධානය වූ මෙම ව්‍යාපෘතිය සඳහා ඔබේ ව්‍යාපාරය පිළිබඳව තොරතුරු දක්වමින් ආකෘති පත්‍රයක් සකස් කරන්න.

තැතහොත්

ඔබ මෑතක දී වෙළෙඳ පොළට හඳුන්වා දුන් නවතම නිෂ්පාදනයක අලෙවිය වැඩි කර ගැනීමට ගැළපෙන ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් පිළියෙල කරන්න. .

(ලකුණු 15යි)

mathematics.lk